පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය - නොවැම්බර් - සතිය - 02

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province

ක්‍රියාකාරකම : **දේශීය නාට්‍ය වර්ග ඉගෙන ගනිමු.**

අරමුණු -

- නාට්‍ය පිළිබඳව විස්තර කරයි
- නාට්‍ය පිළිබඳව යන්න හඳුනාගනියි
- සහයෝගයෙන් කටයුතු කරයි
- දැනුම හා අත්දැකීම් අනෙක් අය හා හුවමාරු කර ගනී
- සතුටින් විවේකය ගත කරයි

පළමු පියවර :පහත සටහන කියවන්න

දෙවන පියවර : පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1 නාට්‍ය ශෛලීන් කීයද ?

2 එක් එක් නාට්‍ය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න

3 නාට්‍ය සඳහා උදාහරණය බැගින් ගෙන රූපද අලවමින් එක් එක් නාට්‍ය පිළිබඳව විස්තර කර කුඩා පොතක් සාදන්න

නාට්‍ය යනු යමක් කර පෙන්වීම යනුවෙන් සරලව හැඳින්විය හැකිය. නාට්‍යයක් ඉදිරිපත් කරන ආකාරය අනුව ශෛලීන් දෙකකි. 1. ලෝක ධර්මී ශෛලිය 2. නාට්‍ය ධර්මී ශෛලිය ලෝකයේ ස්වභාවයට අනුකූලව නාට්‍යක සතර අභිනය භාවිත වන්නේ නම් එය ලෝක ධර්මී ලෙස හඳුන්වයි. මෙහිදී පවත්නා ලෝකයට වඩාත් සමීපව ඉදිරිපත් කිරීමක් දැකිය හැකිය. ලෝක ස්වභාවයට අනුගත නොවන අයුරින් සතර අභිනය භාවිත වන්නේ නම් එය නාට්‍ය ධර්මී ලෙස හඳුන්වයි. ලංකාවේ නාට්‍ය වර්ග කීපයකි.1. තාත්වික නාට්‍ය 2. ශෛලිගත නාට්‍ය 3. ගීත නාට්‍ය 4. මුද්‍රා නාට්‍ය.

තාත්ත්වික නාට්‍ය - යථානුරූපී ස්වභාවයෙන් ම ඉදිරිපත් කරන අතර නරඹන්නාට එය තමාගේ අත්දැකීමක් වශයෙන් විඳ ගැනීමට සලසන්නාවූ නාට්‍ය තාත්ත්වික නාට්‍ය ශෛලීය ලෙස හැඳින්වෙයි. කැලණි පාලම, මෝදර මෝල වැනි නාට්‍ය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

ශෛලිගත නාට්‍ය- ජීවිතයේ එදිනෙදා දක්නට ලැබෙන විවිධ අවස්ථා හා සිද්ධී සැබෑ ස්වරූපයෙන් බැහැර ව අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය විශේෂයක් ලෙස ශෛලිගත නාට්‍ය හැඳින්විය හැකි ය. තාලය හා රිද්මය පදනම් කොට ගෙන දෙබස් උච්චාරණය මෙන් ම නර්තනය යොදා ගැනීම මෙහි දී දැකිය හැකි සුවිශේෂ ලක්ෂණයකි. ඊට ම ආවේණික වූ ශෛලියක් අනුගමනය කරමින් පොතේගුරු මඟින් චරිත වේදිකාවට කැඳවීම සමග ම ඒ ඒ චරිත වේදිකාවට ප්‍රවිෂ්ට වේ. මෙහි දී අභිනයන් මඟින් චරිත නිරූපණය කිරීම මෙන් ම වෙස් මෝස්තර, ගමන් තාල යොදාගැනීම ශෛලිගත නාට්‍යයේ දක්නට ලැබෙන තවත් සුවිශේෂ ලක්ෂණයකි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ මනමේ,සිංහබාහු නාට්‍ය ද හෙන්රි ජයසේන මහතාගේ කුවේණී,හුනුවටයේ කථාව දයානන්ද ගුණවර්ධනයන්ගේ නරිබෑණා, මධුර ජවනිකා යන නාට්‍යද ශෛලිගත නාට්‍ය සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි ය.

ගීත නාටක - නාට්‍යයට අදාළ සියලු ම දෙබස් ගීතයෙන් ඉදිරිපත් කෙරෙන බැවින් එය ගීත නාටක නම් වේ. වාචික අභිනයට ප්‍රමුඛස්ථානයක් ලබාදෙන මෙම ගීත නාට්‍ය රඟ දැක්වීමේ දී නළු නිළියන් විසින් ම ගායනය කළ යුතු අතර ඔවුනට ගායනය සහ රංගනය යන දෙකෙහි ම දක්ෂතා තිබිය යුතු ය. අදහස් ප්‍රකාශනයේ දී ගීතය සමඟ රිද්මානුකූල චලන යොදා ගැනීම මෙහි දි දැකිය හැකි විශේෂත්වයකි. ගීත නාටකවලට උදාහරණ ලෙස ප්‍රේමසිරි කේමදාස මහතාගේ කැලෑමල් නාට්‍ය ද සරච්චන්ද්‍ර මහතාගේ පේමතෝ ජායතී සෝකෝ නාට්‍යය ද මකුලොළුව මහතාගේ දෙපානෝ නාට්‍යය ද දැක්විය හැකි ය. තාත්වික, ශෛලිගත, ගීත නාටක ආදී නාට්‍ය අතර මුද්‍රානාට්‍ය සුවිශේෂ කලා මාධ්‍යයකි.

මුද්‍රා නාට්‍ය - වාචික අභිනයෙන් තොර ව චලන මාධ්‍යයෙන් කිසියම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය කරන ලද මුද්‍රා මඟින් අදහස් ප්‍රකාශ කරන නාට්‍ය මුද්‍රා නාට්‍ය නමින් හඳුන්වයි. මෙහි දී සංගීතයට ප්‍රධාන තැනක් හිමි වන අතර කතා පුවතක් නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම දේශීය මුද්‍රා නාට්‍යවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ය. ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවෙහි ප්‍රභවය කෙරෙහි ඍජු ව ම බලපා ඇත්තේ ඉන්දියානු නර්තන කලාව යි. නූතනයේ බටහිර මුද්‍රා නාට්‍යවල ආභාසයෙන් ඇතැම් ශිල්පීන් මුද්‍රා නාට්‍ය නිර්මාණය කර ඇති බව පෙනේ. 1936 ශාන්ති දේව ඝෝෂ් නිෂ්පාදනය කළ ''සීතාහරණ'' නම් මුද්‍රා නාට්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රානාට්‍ය ලෙස නම් කර ඇත. මුද්‍රා භාවිතයට වඩා ඉඟි යොදාගැනීම හා පසුබිම් ගීත භාවිත කිරීම නිසා දේශීය මුද්‍රා නාට්‍ය ඉඟි නළු යනුවෙන් ද හඳුන්වා ඇත.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මුද්‍රා නාට්‍ය

චිත්‍රසේන මහතා- කරදිය, නල දමයන්ති, චණ්ඩාලිකා, ශිව රංග

වජිරා මහත්මිය - හිම කුමාරි, රන් කිකිළී

ප්‍රේමකුමාර එපිටවල මහතා - සැලළිහිණි, පරෙවිය, ගමන

එස් පණීභාරත මහතා - සත් පත්තිනි, ග්‍රහ අපලය

ඉඹුල්ගොඩ මහතා - උදාව, රන්දද

සහායක ඉගෙනුම් ආධාරක

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය